කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී උපාධිය පළමු වසර විභාගය (ආර්ථික විද්‍යාව)

දෙවන සෙමෙස්තරය අවසන් විභාගය 2024/2025

ECN 1202 - මූලික සාර්ව ආර්ථික විද්‍යාව

කාලය පැය දෙකක් (02) පමණි

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

---

1. එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් 2025 අප්‍රේල් 2 වන දින රටවල් 90 කට පමණ ආනයන සඳහා තීරුබදු ප්‍රකාශයට පත් කරන ලදී. මෙය එක්සත් ජනපදය වෙතට සිදුකරන සියලු ආනයන සඳහා 10% ක නව බදු පැනවීමකි. මීට අමතරව , එක්සත් ජනපදය ශ්‍රී ලංකාවට 44% ක බද්දක් පනවා ඇති අතර, එය ශ්‍රී ලංකාව එක්සත් ජනපදයේ ආනයන මත පනවන තීරුබදු සීමාවන්ගෙන් දළ වශයෙන් අඩකට සමාන වට්ටම් සහිත බදු ප්‍රතිශතයකි. කෙසේ වෙතත්, මෙම නව බදු වල බලපෑම් ශ්‍රී ලංකාව වැනි කුඩා ආර්ථිකයන් සඳහා අහිතකර ලෙස බලපායි.

   අ) ට්‍රම්ප්ගේ තීරුබදු නිසා ශ්‍රී ලංකා ආර්ථිකය මුහුණ දෙන ක්ෂණික අභියෝග මොනවාද යන්න කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 09)

   ආ) අපනයන කෙරෙහි ඇති අහිතකර බලපෑමෙන් මිදීම සඳහා ශ්‍රී ලංකාව විසින් ගතයුතු කෙටිකාලීන සාර්ව ආර්ථික විසඳුම් මොනවාද? (ලකුණු 08)

   ඇ) ශ්‍රී ලංකා අපනයන සඳහා පවතින කැළඹිලි සහිත වෙළඳපළ තත්වය අවම කිරීම සඳහා ඔබ යෝජනා කරන දිගුකාලීන සාර්ව ආර්ථික විසඳුම් මොනවාද? (ලකුණු 08)

2. රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව වැඩි කිරීමට සහ මූලික වැටුප වැඩි කිරීමට රජය විසින් යෝජනා කර ඇති අතර එය රාජ්‍ය වියදම් ඉහළ යාමට හේතු වේ. ඊට අමතරවල විශ්‍රාමිකයින්ගේ වැටුප් වැඩි කිරීම සහ දරිද්‍රතා රේඛාවට පහළින් සිටින පුරවැසියන්ට සහනාධාර වැඩි කිරීම යෝජනා කර ඇති අතර එය සංක්‍රාම වියදම් ඉහළ යාමට හේතු වේ.

   අ) රජයේ වියදම් වර්ග පැහැදිලි කරන්න (ලකුණු 05)

   ආ) රජයේ සංක්‍රාම (හුවමාරු ගෙවීම්) වර්ග මොනවාද? (ලකුණු 05)

   ඇ) රජයේ ආදායම ස්ථාවර පවතින්නේ නම්, දළ දේශීය නිෂ්පාදිත වර්ධනයේ ඔබ අපේක්ෂා කරන්නේ කුමන වෙනස්කම්ද? (ලකුණු 08)

   ඈ) දළ දේශීය නිෂ්පාදිත වර්ධනයේ තිරසාරභාවය සඳහා ආර්ථිකයේ අනෙකුත් අංශවල සිදුවිය යුතු වෙනස්කම් මොනවාද? (ලකුණු 07)

3. ශ්‍රී ලංකාව මෑතකදී රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ, මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම සහ විදේශීය වෙළඳ ගැලපීම් ක්‍රියාත්මක කර ඇති අතර, එය සමස්ත ආර්ථික වර්ධනයට වැදගත් වන බව අවධාරණය කරයි. සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය සහ අනාගත ප්‍රතිපත්ති තීරණය කිරීම සඳහා, බාහිර කම්පන කෙටි කාලීන සහ දිගු කාලීන යන දෙකෙහිම නිමැවුම් සහ මිල මට්ටම් කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ පැහැදිලි අවබෝධයක් අත්‍යවශ්‍ය වේ.

අ) කෙටි කාලීන සමස්ත සැපයුම් වක්‍රය (SRAS) තිරස් අතටත් දිගු කාලීන සමස්ත සැපයුම් වක්‍රය (LRAS) සිරස් අතටත් ඇත්තේ මන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ) පහත සඳහන් වෙනස්කම්වල කෙටිකාලීන සහ දිගු කාලීන බලපෑම් පැහැදිලි කිරීමට සමස්ත ඉල්ලුම (AD) සහ සමස්ත සැපයුම (AS) ආකෘතිය භාවිතා කරන්න:

a) රජයේ වියදම්වල වැඩිවීම

b) මුදල් ප්‍රතිපත්තිය ප්‍රසාරණය

c) ආනයනවල වැඩිවීම (ලකුණු 05 බැගින් )

4. ශ්‍රී ලංකාව තිරසාර ආර්ථික වර්ධනයක් අත්කර ගැනීමේදී විවිධ අභියෝගවලට මුහුණ දී ඇති අතර, සාර්ව ආර්ථික දර්ශක කිහිපයක් ප්‍රශස්ත මට්ටම් කරා ළඟා වීමට අපොහොසත් වී ඇත. වෙළඳ ලිහිල්කරණය සහ වෙළඳපොළ නැඹුරු ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමෙන් පසු, රට එහි ආර්ථික ප්‍රතිපත්තියේ සැලකිය යුතු අභියෝගවලට මුහුණ දී තිබේ. මෙම කාල පරිච්ඡේදය තුළ, උද්ධමනය අස්ථාවර වී ඇති අතර, ආර්ථික ස්ථාවරත්වයට නිරන්තර අභියෝගයක් ලෙස පවතී.

අ) උද්ධමනය යනු කුමක්ද? ආර්ථිකයක එය මනිනු ලබන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

ආ) උද්ධමනය සඳහා ප්‍රධාන හේතු සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුරේදී, එක් එක් හේතුව සාමාන්‍ය මිල මට්ටමට සහ සමස්ත ආර්ථික ස්ථාවරත්වයට බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ඇ) මුදල් සැපයුම් වර්ධනය සහ උද්ධමනය අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න. ඔබේ පිළිතුරේ මුදල් ප්‍රමාණ න්‍යාය වෙත යොමු වී මුදල් සැපයුම වැඩි කිරීම සැමවිටම උද්ධමනයට හේතු වේද යන්න සාකච්ඡා කරන්න. (ලකුණු 10)

5. ගෙවුම් ශේෂය (BOP) ලෝකයේ සෙසු රටවල් සමඟ ගනුදෙනු පිළිබිඹු කිරීමෙන් රටේ ආර්ථිකය නිරෝගීද යන බව පෙන්නුම් කරයි. ශ්‍රී ලංකාවේ, විනිමය අනුපාතිකයේ උච්චාවචනයන් සමඟ ගෙවුම් ශේෂයේ වෙනස්කම් ආර්ථික ස්ථාවරත්වයට බලපා ඇත. මෙම වෙනස්කම් ආර්ථික ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීමට සහ ශක්තිමත් මූල්‍ය ස්ථාවරත්වයකට මග පෑදීමට අවස්ථාවක් නිර්මාණය කරයි.

අ) ගෙවුම් ශේෂය (BOP) යනු කුමක්ද? එහි ප්‍රධාන ගිණුම් දෙක සහ එහි සංරචක කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

ආ) විනිමය අනුපාත පද්ධතියක් යනු කුමක්ද? විනිමය අනුපාත පද්ධති වර්ග තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

ඇ) සැබෑ විනිමය අනුපාතය කුමක්ද සහ එය නාමික විනිමය අනුපාතයට වඩා වෙනස් වන්නේ කෙසේද? සැබෑ විනිමය අනුපාතයේ වෙනස්කම් රටක වෙළඳ ශේෂයට සහ සමස්ත ආර්ථිකයට බලපාන්නේ කෙසේද යන්න සාකච්ඡා කරන්න. (ලකුණු 12)

6.

අ) නූතන ආර්ථිකයේ මහ බැංකුවක ප්‍රාථමික අරමුණු සාකච්ඡා කරන්න. අදාළ උදාහරණ සමඟ ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 08)

ආ) මහ බැංකුවක් විසින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් පැහැදිලි කරන්න. මෙම මහ බැංකු කාර්යයන් වාණිජ බැංකුවලින් වෙන්කර හඳුනා ගන්නේ කෙසේද? (ලකුණු 08)

ඇ) මහ බැංකුව එහි මුදල් ප්‍රතිපත්ති මෙවලම් හරහා ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 09)

7.

අ) ආර්ථිකයක දක්නට ලැබෙන ප්‍රධාන විරැකියාවන් විස්තර කරන්න. මෙම ආකාරයේ විරැකියාවන් ඇතිවන්නේ කෙසේද? (ලකුණු 08)

ආ) ඉහළ විරැකියාව බරපතල සාර්ව ආර්ථික ගැටලුවක් ලෙස සලකන්නේ ඇයි? (ලකුණු 08)

ඇ) ශ්‍රී ලංකාවේ විරැකියාවේ සමාජීය හා ආර්ථික ප්‍රතිවිපාක විවේචනාත්මකව අගයන්න. (ලකුණු 09)

8.

පහත සඳහන් ඕනෑම <u>තුනක් (03)</u> ක් සඳහා කෙටි සටහන් ලියන්න.

අ) මූලික මිල සහ වෙළඳපල මිල

ආ) සැබෑ දළ දේශීය නිෂ්පාදිතය සහ නාමික දළ දේශීය නිෂ්පාදිතය

ඇ) භෞතික ප්‍රාග්ධනය සහ මානව ප්‍රාග්ධනය

ඈ) භාණ්ඩාගාර බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත්

ඉ) පොලී අනුපාත වර්ග

ඊ) ආයෝජන ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිපත්ති

උ) ශ්‍රම වෙළඳපොළ තොග සහ ප්‍රවාහ (කොටසකට ලකුණු 8.33)

.............................................. අවසානය ..............................................